படிவம் (இலக்கம் 02)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා - 290

ආයතනයේ නම - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடரிலக்கம் - 290

நிறுவனத்தின் பெயர் - அரசாங்க சேவை ஆணைக்குழு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களையும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்குச் சமர்ப்பித்தல்.

Parliamentary Series No - 290

Name of the institution - Public Service Commission

Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

ආකෘති (අංක.01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා - 290

ආයතනයේ නම - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	නිවැරදි කිරීමට ගත් පියවරයන් හා වර්තමාන තත්ත්වය
පළමු කොටස : 96.00 සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර දෙකක් පවත්වා නොතිබුණි	පෙන්වා දී ඇති පරිදි සියලුම සංචිත වාහන වල රාජ්‍ය ලාංඡනයන් පින්තාරු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. 2020.08.23 දින සිට 2021.12.23 දින දක්වා අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී ඇති බැවින් අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාත්මක නොවීය.
දෙවැනි කොටස : 42.00 ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අභිතකර මට්ටමේ විය. ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි. හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලභා කර ගැනීම මැන බැලීම සඳහා කාර්ය සාධන ඉලක්ක නියම කර නොතිබුණි. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි. සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි. විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කල යුතු කර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	ආයතනයේ ගිණුම් පිළිබඳ මතය ව්‍යාවනය කිරීමක් හෝ අභිතකර මතයක් ප්‍රකාශ කර නොමැති අතර “හැර මතයක්” ලබා දී ඇත. 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයේ ස්වභාවය අනුව තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒ සඳහා ලභා වීමේ ප්‍රගතිය මැන බැලීම වෙනුවෙන් දර්ශක සකස් කර ඇත. රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි 12.1 ඡේදයේ ආයතන විසින් ඉටු කළ යුතු කාර්ය භාරය පැහැදිළි වන ලෙස එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්ය සාධක දර්ශක 03 ක් සම්බන්ධව සඳහන් නොවේ. කෙසේ වුවද, 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ ඒ ඒ අංශ විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට අදාලව කාර්ය සාධන දර්ශක හඳුනා ගෙන ඇත. 2021 වර්ශයේ පැවති කොරෝණා වසංගත තත්ත්වය හේතුවෙන් රාජ්‍ය නිලධාරීන් සීමාසහිතව රාජකාරියට ගෙන්වා ගැනීම නිසා එම කාලය තුළ පුහුණු වැඩසටහන් සැලසුම් කල පරිදි පැවැත්වීමට නොහැකි වූ නමුත් සේවා අවශ්‍යතාවය මත වෙනත් ආයතන මගින් පවත්වන ලද පුහුණු වැඩමුළු හා මාර්ගගත පුහුණු වැඩමුළු සඳහා නිලධාරීන් සහභාගී කරවීමට කටයුතු කර ඇත.

ඩබ්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර.
බත්තරමුල්ල

පිටපත් -

01. අග්‍රාමාත්‍ය ලේකම්
02. සභාපති - රාජ්‍ය ගිණුම් කාරක සභාව

} අවශ්‍ය කටයුතු සඳහා සහ කාරුණික දැනගැනීම සඳහා